**ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජික ධුරයට නිර්දේශ කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ සහ 155අ (1) ව්‍යවස්ථා යටතේ, සහ 155අ (2) සහ 155අ (3) ව්‍යවස්ථාවන්ට යටත්ව, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ ඇතිවී තිබෙන පුරප්පාඩු සහ ඉදිරියේ දී ඇතිවීමට නියමිත පුරප්පාඩුව පිරවීමට නිර්දේශ කරනු ලැබීම සඳහා, මේ පිළිබඳ උනන්දුවක් දක්වන තැනැත්තන්ගෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් නව අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

අයදුම්පත්‍ර, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියෙහි (www.parliament.lk) "ක්ෂණික පිවිසුම්" යටතේ *'ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජික ධුරයට නිර්දේශ කිරීම'* නමින් පළ කර ඇති අයදුම්පත්‍රයට අනුකූලව පිළියෙළ කරනු ලැබිය යුතු ය. යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **2026 ජුලි 31** වැනි දින හෝ ඊට පෙර,

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්**
**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ**

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ constitutionalcouncil@parliament.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතු ය.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයේ විෂයය ලෙස *'ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජික ධුරයට නිර්දේශ කිරීම'* යනුවෙන් සඳහන් කරන්න.

මෙම පුරප්පාඩු සඳහා 2026 මාර්තු 27 දින පුවත්පත් සහ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීම් මත මීට පෙර අයදුම්පත් කැඳවන ලද අවස්ථාවේ අයදුම්පත්‍ර ඉදිරිපත් කරන ලද අයදුම්කරුවන් ද නැවතත් අයදුම් කිරීමට අපේක්ෂා කරන්නේ නම්, නව අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නියමය පරිදි පළ කරන ලදී.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්**
**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.**

2026 ජුලි 16